සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Sabaragamuwa Provincial Department of Education

**අවසාන වාර පරීක්ෂණය • 13 ශ්‍රේණිය - 2025**

| | | | | |
|---|---|---|---|---|
| ආර්ථික විද්‍යාව I<br>Economics I | 21 | S | I | පැය දෙකයි<br>Two Hours |

**උපදෙස්:**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.**
- **උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැළකිල්ලෙන් කියවා පිළිපදින්න.**
- **1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට ①,②,③,④ සහ ⑤ යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන පිළිතුර තෝරාගෙන එය පිළිතුරු පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි ⊗ යොදන්න.**

1. ආවස්ථික පිරිවැයක් දැරිය යුතු යෙදවුම් සීමිත වුවද අවශ්‍යතා ඉටු කරගත හැකි විකල්ප සීමිත නොවන විට
   (1) ස්වභාවික සම්පත් අධි භාවිතයට ලක් වේ.
   (2) තාර්කික මිනිසුන් තෝරා බේරා ගැනීමේ ප්‍රශ්නවලට මුහුණ දෙති.
   (3) මිල අඩුම නිෂ්පාදිත තේරීමට පාරිභෝගිකයෝ පෙළඹෙති.
   (4) සියලු මිනිසුන්ට සාගින්න නිවා ගැනීමට අවශ්‍ය ආහාර නිපදවා ගැනීමට නොහැකි වේ.
   (5) කිසිදු ආර්ථිකයක් අඛණ්ඩව ආර්ථික වෘද්ධියක් අත්කර ගැනීමට අසමත් වේ.

2. ආර්ථික විද්‍යාත්මකව නිවැරදි ප්‍රකාශය හඳුනාගන්න.
   (1) ආයෝජනය තොගයක් වුවද ප්‍රාග්ධනය ප්‍රවාහයකි.
   (2) මිනිසා මැදිහත් වී භූමි සාධකය සංවර්ධනය කළ විට එය ස්වභාවික ප්‍රාග්ධනයට අයත් වේ.
   (3) ශ්‍රමයේ සහ භූමියේ ඵලදායිතාව ඉහළ නැංවීමට ප්‍රාග්ධන සාධකය බිහි කරගෙන තිබේ.
   (4) ප්‍රාග්ධනය අයත් වන්නේ ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි සම්පත් වලට ය.
   (5) පෞද්ගලික පරිභෝජනය සඳහා යොදාගන්නා යාන වාහන ආදිය ස්ථාවර ප්‍රාග්ධනයට අයත් වේ.

3. වියට්නාමය, ලාඕසය සහ චීනය අයත් වන්නේ පහත සඳහන් කුමන ආර්ථික පද්ධතියටද?
   (1) ලිබරල් වෙළෙඳපොළ
   (2) සමාජීය වෙළෙඳපොළ
   (3) මධ්‍ය සැලසුම්ගත
   (4) සමාජවාදී සැලසුම්ගත
   (5) සමාජවාදී වෙළෙඳපොළ

4. ආර්ථිකයකට සමජාතීය සම්පත් සම්භාරයක් භාවිතයෙන් උපරිම වශයෙන් X ඒකක 150ක් නිපදවිය හැකි අතර Y හි ආන්තික ආවස්ථික පිරිවැය 0.33කි. (1/3කි). මෙම ආර්ථිකය X ඒකක 100ක් නිපදවයි නම් ඒ සඳහා දැරිය යුතු ආවස්ථික පිරිවැය Y ඒකක වලින්
   (1) 450 කි. (2) 400 කි. (3) 300 කි. (4) 150 කි. (5) 3 කි.

5. කිසියම් භාණ්ඩයක, අනෙකුත් සාධක නොවෙනස්ව පවතිනම්, මිල ඉහළ යන විට මිල ප්‍රතිවිපාකය ඔස්සේ ඉල්ලුම් ප්‍රමාණය අඩුවුවද ආදායම් ප්‍රතිවිපාකය ඔස්සේ ඉල්ලුම් ප්‍රමාණය වැඩිවේ නම්,
   (1) වෙළෙඳපොළේ මෙම භාණ්ඩය සඳහා ආදේශක දක්නට නොලැබේ.
   (2) මෙය බාල භාණ්ඩයක් වුවද ගිෆන් භාණ්ඩයක් නොවේ.
   (3) මෙහි ආදායම් හා ආදේශන යන ප්‍රතිවිපාක දෙකම ඉල්ලුම් නීතිය ශක්තිමත් කරයි.
   (4) මෙහි ආදායම් හා ආදේශන යන ප්‍රතිවිපාක දෙකම ඉල්ලුම් නීතියට විරුද්ධව හැසිරෙයි.
   (5) පාරිභෝගික ආදායම වැඩිවුවහොත් මෙම භාණ්ඩයේ ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වේ.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

6. X භාණ්ඩයේ මිල වෙනස්වන විට සැපයුම් නම්‍යතාවේ වෙනස ශූන්‍ය වේ නම් මෙම භාණ්ඩයේ සැපයුම් වක්‍රය
(1) තිරස් රේඛාවකි
(2) අනම්‍ය වේ
(3) ඒකීය නම්‍ය වේ
(4) නම්‍ය වේ
(5) පූර්ණ නම්‍ය වේ

7. තරඟකාරී වෙළෙඳපොළක් සමතුලිතව පවතින විට යෙදවුම්වල මිල අඩු වුවහොත් පහත සඳහන් දෑ කෙරෙහි ඇතිකරන බලපෑම නිවැරදිව දැක්වෙන පිළිතුර හඳුනාගන්න.

| | ඉල්ලුම | සැපයුම | ඉල්ලුම් ප්‍රමාණය | සැපයුම් ප්‍රමාණය | මිල |
|---|---|---|---|---|---|
| (1) | වෙනස් නොවේ | වැඩිවේ | වැඩිවේ | අඩුවේ | අඩුවේ |
| (2) | වැඩිවේ | වැඩිවේ | වෙනස් නොවේ | අඩුවේ | අඩුවේ |
| (3) | වෙනස් නොවේ | අඩුවේ | අඩුවේ | අඩුවේ | වැඩිවේ |
| (4) | වැඩිවේ | වැඩිවේ | වැඩිවේ | අඩුවේ | වෙනස් නොවේ |
| (5) | වෙනස් නොවේ | වැඩිවේ | වැඩිවේ | වැඩිවේ | වැඩිවේ |

8. අනෙකුත් කරුණු නොවෙනස්ව පවතිද්දී, පාරිභෝගික ආදායම 10%කින් ඉහළ යන විට පාන් ඉල්ලුම 10%කින් පහළ යයි නම් පාන්,
(1) ගිෆන් භාණ්ඩයකි.
(2) ගිෆන් නොවන බාල භාණ්ඩයකි.
(3) ඒකීය නම්‍ය ඉල්ලුමක් සහිත භාණ්ඩයකි.
(4) අත්‍යවශ්‍ය භාණ්ඩයකි.
(5) බාල භාණ්ඩයකි.

9. සහල් මිලේ සාපේක්ෂ වෙනසකට ඉල්ලුම් ප්‍රමාණය විශාලම ප්‍රතිචාරයක් දක්වනු ඇත්තේ පහත සඳහන් කවර භාණ්ඩයේදීද?
(1) වියළි හාල් මැස්සන්
(2) පරිප්පු
(3) මුං ඇට
(4) සීනි
(5) පාන් පිටි

10. භාණ්ඩයක වෙළෙඳපොළ ඉල්ලුම වැඩි වීමකදී මිල ඉහළ යාමේ ප්‍රමාණය වඩාත්ම විශාල අගයක් ගනු ලබන්නේ සැපයුමේ කුමන මිල නම්‍යතාවක් යටතේ ද?
(1) පූර්ණ අනම්‍ය
(2) අනම්‍ය
(3) ඒකීය නම්‍ය
(4) නම්‍ය
(5) පූර්ණ නම්‍ය

11. පහත සඳහන් සියලුම භාණ්ඩවල මිල 20% කින් ඉහළ යනවිට මුළු අයභාරය වඩිම ප්‍රතිශතයකින් ඉහළ යනු ඇත්තේ කුමන භාණ්ඩයේ ද?
(1) හයිලන්ඩ් යෝගට්
(2) දුඹුරු සීනි
(3) මැලිබන් ක්‍රීම් ක්‍රැකර්
(4) පොල්
(5) තලපත් මාළු

12. වෙළෙඳපොළක ඉල්ලුම ද Qd=a-bP බවත්; Qs=-c+dP බවත් උපකල්පනය කරන්න. රජය මෙම භාණ්ඩය සඳහා රු. 20ක නිශ්චිත බද්දක් නිෂ්පාදකයින්ගෙන් අය කිරීමට තීරණය කළහොත්
(1) බද්දේ ප්‍රමාණයට සමාන ප්‍රමාණයකින් සැපයුම් වක්‍රය වමට විතැන් වේ.
(2) බදු බර නිෂ්පාදකයින් සහ පාරිභෝගිකයින් අතර සමව බෙදී යයි.
(3) බදු බරින් වැඩි අනුපාතයක් නිෂ්පාදකයින්ට දැරීමට සිදු වේ.
(4) බදු බරින් වැඩි ප්‍රතිශතයක් පාරිභෝගිකයින්ට දැරීමට සිදු වේ.
(5) බදු බර පාරිභෝගිකයින් හා නිෂ්පාදකයින් අතර බෙදී යයි.

13. ඉදිරියේදී හටගත හැකි විශාල නියඟයකට මුහුණ දීම සඳහා විශාල සහල් අතිරික්තයක් ලබාගැනීම සඳහා පහත සඳහන් ප්‍රතිපත්තිවලින් යෝග්‍යවනුයේ කුමක්ද?
(1) සමතුලිත මිලට වඩා අඩු උපරිම මිලක් නියම කිරීම
(2) සමතුලිත මිලට වඩා වැඩි සහතික මිලක් යටතේ ඌණ පූර්ණ ගෙවීමක් සිදු කිරීම
(3) නිෂ්පාදකයින් හට නිශ්චිත සහනාධාරයක් ලබා දීම
(4) සමතුලිත මිලට ඉහළින් අවම මිලක් නියම කිරීම
(5) දැනට ලබා දෙන පොහොර සහනාධාරය අඛණ්ඩව පවත්වාගෙන යාම


www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

14. පාරිභෝගිකයින්ගෙන් නිෂ්පාදකයින් වෙත මූර්ත ආදායම් ප්‍රතිව්‍යාප්ත කිරීමට හේතුවන සූක්ෂම ආර්ථික ප්‍රතිපත්තිය හඳුනාගන්න.
   (1) ගැනුම්කරුවන් මත නිශ්චිත බද්දක් පැනවීම
   (2) විකිණුම්කරුවන් මත නිශ්චිත බද්දක් පැනවීම
   (3) සඵල උපරිම මිල පාලනයක් ක්‍රියාත්මක කිරීම
   (4) සඵල අවම මිල පාලනයක් ක්‍රියාත්මක කිරීම
   (5) නිෂ්පාදකයින් සඳහා නිශ්චිත සහනාධාරයක් සැපයීම

15. විචල්‍ය සාධක අනුපාත නීතියට අනුව සාමාන්‍ය ඵලදාව ඉහළ යන සෑම විටම
   (1) ආන්තික ඵලදාව ඉහළ යයි
   (2) ආන්තික ඵලදාව සාමාන්‍ය ඵලදාව ඉක්මවා යයි
   (3) ආන්තික ඵලදාව පහළ වැටෙයි
   (4) ආන්තික ඵලදාව සාමාන්‍ය ඵලදාවට වඩා අඩු අගයක් ගනියි
   (5) මුළු ඵලදාව වැඩිවන අනුපාතයකින් ඉහළ යයි

16. නිවැරදි ප්‍රකාශය හඳුනා ගන්න.
   (1) වක්‍ර පිරිවැයට අයත් සියලුම අයිතම ස්ථාවර පිරිවැයටද අයත් වේ.
   (2) ස්ථාවර පිරිවැයට අයත් සියලුම අයිතම ගිල්වූ පිරිවැයට ද අයත් වේ.
   (3) යන්ත්‍ර සූත්‍රවල ධාවන වියදම් ආරෝපිත පිරිවැයට අයත් වේ.
   (4) ආර්ථික ක්ෂය වීම් ගණකාධිකාරි පිරිවැයට අයත් වේ.
   (5) ක්‍රම ක්ෂය ගාස්තු ආර්ථික පිරිවැයට අයත් නොවේ.

17. කෙටි කාලයේදී පූර්ණ තරගකාරී ආයතනයක් සමතුලිත වෙන විට ශුන්‍ය වනුයේ කුමක්ද?
   (1) ප්‍රාමාණික ලාභය
   (2) සාමාන්‍ය අයභාරය
   (3) ආන්තිකය අයභාරය
   (4) ආන්තික පිරිවැය
   (5) ආන්තික ආර්ථික ලාභය

18. භාණ්ඩ වෙළඳපොලේ යම් ආයතනයක් පහළට බෑවුම් වන ඉල්ලුම් වක්‍රයට මුහුණ දෙන නමුත් එය ප්‍රචාරණයේ නොයෙදෙයි නම් එය අයත් වන වෙළෙඳපොළ ව්‍යුහය වනුයේ
   (1) ඒකාධිකාරය
   (2) ද්වි අධිකාරය
   (3) කතිපයාධිකාරිය
   (4) ඒකාධිකාරී තරගය
   (5) පූර්ණ තරගය

19. පහත සඳහන් දෑ අතුරින් රටක දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාමට තුඩු දෙන කරුණ හඳුනාගන්න.
   (1) නිදහස් උත්සවය සැමරීමට රජය රුපියල් මිලියන 300 ක් වියදම් කිරීම
   (2) විශ්‍රාමිකයින්ගේ වැටුප් වැඩි කිරීමට රජය රුපියල් මිලියන 1000ක් වියදම් කිරීම
   (3) අදාළ වර්ෂය තුළ US$ මිලියන 1800ක මෝටර් රථ ආනයනය කිරීම
   (4) මහ බැංකුව වාණිජ බැංකු වෙත රු. බිලියන 20ක භාණ්ඩාගාර බිල්පත් විකිණීම
   (5) රාජ්‍ය ආයතනවල පාවිච්චි කළ වාහන අලෙවිකර රු. මිලියන 500ක් උපයා ගැනීම

20. පහත සඳහන් ආයතනික ඒකක ඇතුළත්වන ආයතනික අංශ නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?

| | HH | NFC | FC | GG | NPISH |
|---|---|---|---|---|---|
| (1) | රෝහල් ගතවූවන් | ජල සම්පාදන මණ්ඩලය | DFCC බැංකුව | පොලීසිය | ක්‍රීඩා සමාජ |
| (2) | සිරගත වූවන් | මහජන බැංකුව | විදුලි බල මණ්ඩලය | පාසල් | නගරසභා |
| (3) | කන්‍යාරාම | රක්ෂණ සංස්ථාව | සතොස | ලංගම | දේශපාලන පක්ෂ |
| (4) | වැඩිහිටි නිවාස | දෙරණ රූපවාහිනි නාලිකාව | නගරසභාව | මිල්කෝ | සිර ගෙවල් |
| (5) | සිල්ලර කඩ | අර්ථසාධක අරමුදල | මහබැංකුව | දුම්රිය සේවය | සිංහ සමාජය |

21. වියදම් ප්‍රවේශය යටතේ දළ දේශීය නිෂ්පාදිතය ඇස්තමේන්තු කිරීමේ දී ඇතුළත් නොකරනුයේ පහත සඳහන් දෑ අතුරින් කුමක් ද?
   (1) ශුද්ධ අපනයන
   (2) පෞද්ගලික පරිභෝජනය
   (3) රාජ්‍ය පරිභෝජනය
   (4) දළ ආයෝජනය
   (5) දළ මිශ්‍ර ආදායම්



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

22. ශ්‍රී ලංකාවේ පවත්නා වෙළෙඳපොළ මිල මත දළ දේශීය නිෂ්පාදිතය US$ බිලියන 99ක් වී ඇත්තේ කුමන වර්ෂයේදී ද?
(1) 2024 (2) 2023 (3) 2022 (4) 2021 (5) 2018

23. ආන්තික පරිභෝජන නැඹියාව ආන්තික ඉතුරුම් නැඹියාවෙන් බෙදූ විට ලැබෙන අගය 3ක් නම් ස්වාධීන ආයෝජන රු. බි. 100කින් ඉහළ දැමුවහොත් ඉතුරුම් $ බිලියන
(1) 25කින් වැඩි වේ
(2) 50කින් වැඩි වේ
(3) 80කින් වැඩි වේ
(4) 100කින් වැඩි වේ
(5) 150කින් වැඩි වේ

24. සරල ආර්ථිකයක ඉතුරුම්: S=-500+0.2Y; I=1000ක් බව සිතන්න. අනෙකුත් සාධක නොවෙනස්ව පවතිද්දී ඉතුරුම් S=-500+0.3Y ලෙස ඉහළ ගියහොත්, සමතුලිත ජාතික ආදායම
(1) 5000 කින් වැඩිවේ.
(2) 3500 කින් වැඩිවේ.
(3) 2500 කින් අඩුවේ.
(4) 2500 කින් වැඩිවේ.
(5) වෙනස් නොවේ.

25. චක්‍රීය ප්‍රවාහය තුළ සමාහාර වියදම ප්‍රසාරණයට හේතුවන කරුණක් වන්නේ කුමක් ද?
(1) ආන්තික ඉතුරුම් නැඹියාව වැඩිවීම
(2) ස්වාධීන ඉතුරුම් ඉහළ යාම
(3) අපනයන ඉහළ යාම
(4) ආනයන ඉහළ යාම
(5) ශුද්ධ බදු ඉහළ යාම

26. පොදු මිල මට්ටමේ ඉහළ යාමක් නිසා පහත සඳහන් විචල්‍යයන්ගෙන් අගය වැඩිවෙන්නේ කුමන විචල්‍යයේද?
(1) මූර්ත ආදායම
(2) මුදලේ බාහිර අගය
(3) නාමික ආදායම
(4) නාමික පොලී අනුපාතය
(5) මූර්ත පොලී අනුපාතය

27. මූල්‍ය වෙළෙඳපොළේ පිළිණපත්වල මිලගණන් ඉහළයයි නම් එයින් ගම්‍ය වන්නේ කුමක් ද?
(1) මූල්‍ය පද්ධතිය තුළ ද්‍රවශීලතාව ඉහළයන බවයි.
(2) සාමාන්‍ය පොලී අනුපාත ඉහළ යන බවයි.
(3) සංකෝචනාත්මක මූල්‍ය ප්‍රතිපත්තියන් අනුගමනය කරන බවයි.
(4) වත්කමක් ලෙස මුදලට ඇති ඉල්ලුම අඩු වේ.
(5) අන්තර් බැංකු ඒක්ෂණ පොලී අනුපාතය ඉහළ යයි.

28. $M_2b$ මුදල් සැපයුම තුළ ඇති මහජනයා සතු ද්‍රවශීලතාව ඉහළම වත්කම වනුයේ කුමක් ද?
(1) ඉල්ලුම් තැන්පතු
(2) ඉතුරුම් තැන්පතු
(3) ස්ථාවර තැන්පතු
(4) විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු
(5) ව්‍යවහාර මුදල්

29. වාණිජ බැංකුවක තැන්පතු රු. 10 000ක්ද, අධි සංචිත රු. 2 000ක් ද පවතින අතර ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10% කි; මෙම බැංකුව ඇතුලත්වන බැංකු පද්ධතියට ඉහත අධිසංචිතය පදනම් කරගෙන ලබා දිය හැකි උපරිම ණය ප්‍රමාණය
(1) 20 000කි
(2) 8 000කි
(3) 6 000කි
(4) 4 000කි
(5) 2 000කි

30. පහත සඳහන් කරුණු අතුරින් මුදල් සැපයුම ඉහළ යාමට හේතු නොවන කරුණ කුමක් ද?
(1) එක්දින ප්‍රතිපත්ති අනුපාතිකයේ පහළ දැමීමක්
(2) වාණිජ බැංකු සතු ශුද්ධ විදේශ වත්කම් ඉහළ යාමක්
(3) ඉතුරුම් තැන්පතු හිමියන්ට හරපත් මිලියනයක් අලුතෙන් නිකුත් කිරීම
(4) ණයපත් භාවිතයෙන් කරණු ලබන මිලට ගැනීම් ඉහළ යාම
(5) මහ බැංකුව වාණිජ බැංකු සමඟ ප්‍රතිවිකුණුම් ගිවිසුම්වලට එළැඹීම

31. බැහැර කළ හැකි නමුත් පරිභෝජනයේ තරගකාරීත්වයක් නොමැති භාණ්ඩයක් වනුයේ කුමක් ද?
(1) ජාතික ආරක්ෂාව
(2) අන්තර්ජාලය
(3) සාගරයේ මසුන්
(4) ජංගම දුරකතන
(5) දැනුම



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

32. පූර්ණ තරගකාරී වෙළෙඳපොළක හුවමාරු වන භාණ්ඩයක පරිභෝජනයේදී පමණක් ධන බාහිරතාවක් පවතීනම් වෙළෙඳපොළ සම්බන්ධව නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) සම්පත් බෙදා වෙන්කිරීම කාර්යක්ෂම තත්ත්වයක පවතී.
(2) සම්පත් බෙදා වෙන්කිරීම කාර්යක්ෂමතාවට ගෙන ඒම සඳහා පරිභෝජනය ඉහළ දැමිය යුතුය.
(3) සමාජයට ලැබෙන ශුභසාධනය ඉහළ නැංවීමට නම් නිෂ්පාදනය සීමා කළ යුතු ය.
(4) මෙය වෙළෙඳපොළ තුලින් ඌණ පරිභෝජනයක් සිදුවන අවගුණ භාණ්ඩයකි.
(5) වෙළෙඳපොළ කාර්යක්ෂමතාවට ගෙන ඒමට නම් පාරිභෝගිකයින් මත බදු පැනවීමට සිදුවේ.

33. පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි වනුයේ කුමක් ද?
(1) ආණ්ඩුවේ ආදායම හා ප්‍රදානවලින් පුනරාවර්තන වියදම් අඩුකළ විට වර්තන ගිණුමේ ශේෂය ලැබේ.
(2) සමස්ත අයවැය ශේෂයට පොලී ගෙවීම් එකතුකර ප්‍රාථමික ගිණුමේ ශේෂය ලබා ගනී.
(3) සමස්ත අයවැය හිඟයෙන් ණය ආපසුගෙවීම් අඩුකර දළ මූල්‍යන අවශ්‍යතා ලබා ගනී.
(4) රාජ්‍ය ආදායමෙන් මුළු වියදම අඩුකර සමස්ත ශේෂය ලබා ගනී.
(5) සමස්ත අයවැය හිඟයක් පවතීනම් අනිවාර්යයෙන්ම ප්‍රාථමික ගිණුමේද හිඟයක් පවතී.

34. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සමානුපාතික බද්දකට උදාහරණයක්
(1) උපයන විට ගෙවීමේ බද්ද
(2) පෞද්ගලික ආදායම් බද්ද
(3) මත්පැන් මත නිෂ්පාදන බද්ද
(4) සමාගම් ආදායම් බද්ද
(5) රඳවා තබාගැනීමේ බද්ද

35. රාජ්‍ය සේවකයින්ගේ වැටුප් ඉහළ නැංවීම අයත් වන්නේ,
(1) මූල්‍ය ප්‍රතිපත්තියට ය.
(2) ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියට ය.
(3) සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තියට ය.
(4) ඍජු පාලන ක්‍රමවලට ය.
(5) ප්‍රසාරණාත්මක මූල්‍ය ප්‍රතිපත්තියට ය.

36. පහත දැක්වෙන්නේ A හා B යන රටවල් දෙකෙහි නිෂ්පාදන හැකියා වක්‍රයන් ය. රටවල් දෙක අතර වෙළෙඳාමක් හටගනීනම් රටවල් දෙකම එකඟවන හුවමාරු අනුපාතයක් වනුයේ
(1) 1X=1Y
(2) 1X=0.25Y
(3) 1Y=4.0X
(4) 1Y=5X
(5) 1X=0.5Y




37. ශ්‍රී ලංකාවේ අපනයන සංයුතියේ වර්තමාන තත්ත්වය වඩාත් නිවරදිව පෙන්වන පිලිතුර හඳුනාගන්න.

| | කෘෂිකාර්මික අපනයන % | කාර්මික අපනයන % |
|---|---|---|
| (1) | 22 | 78 |
| (2) | 20 | 80 |
| (3) | 18 | 82 |
| (4) | 16 | 84 |
| (5) | 26 | 74 |

38. දේශීය නිෂ්පාදකයා ආරක්ෂා කරගැනීමට ආනයන මත තීරුබදු පැනවීමක් සිදුවන විට සඵල ආරක්ෂණ අනුපාතිකය ඉහළ යාමට හේතුවන සාධකය හඳුනාගන්න.
(1) නිමි භාණ්ඩය මත නිශ්චිත බද්දක් වෙනුවට අනුපාතික බද්දක් පැනවීම
(2) නිමි භාණ්ඩය මත අයකරන තිරු බදු ප්‍රතිශතය අඩු කිරීම
(3) ආනයනික අන්තර් භාණ්ඩ මත පැනවූ තීරු බදු ප්‍රතිශතය අඩු කිරීම
(4) නිමි භාණ්ඩය හා අන්තර් භාණ්ඩය මත සමාන ප්‍රතිශතයකින් තීරු බදු පැනවීම
(5) අන්තර් භාණ්ඩ මත තීරුබදු සහ නිමි භාණ්ඩය මත තීරු බදු මුළුමනින්ම ඉවත් කිරීම



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub

39. ශ්‍රී ලංකාවේ රජයට ඇමරිකාවෙන් ඖෂධ තොගයක් පරිත්‍යාග කරයි නම් එය මෙරට ගෙවුම් ශේෂ ලේඛනයේ සටහන් වන්නේ කෙසේද?

| | බැර | හර |
|---|---|---|
| (1) | ද්විතීයික ආදායම් ගිණුම | භාණ්ඩ ගිණුම |
| (2) | ද්විතීයික ආදායම් ගිණුම | සේවා ගිණුම |
| (3) | ප්‍රාග්ධන ගිණුම | භාණ්ඩ ගිණුම |
| (4) | භාණ්ඩ ගිණුම | මූල්‍ය ගිණුම |
| (5) | ප්‍රාථමික ආදායම් ගිණුම | සේවා ගිණුම |

40. ගෙවුම් ශේෂ ලේඛනයේ සමස්ත ශේෂය ලෙස හඳුන්වන්නේ කුමක් ද?
(1) භාණ්ඩ ගිණුමේ ශේෂය
(2) භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය
(3) ජංගම ගිණුමේ ශේෂය
(4) මූල්‍ය ගිණුමේ ශේෂය
(5) ශුද්ධ ජාත්‍යන්තර සංචිතයේ වෙනස

41. කිසියම් රටක අපනයනවල මිල ඉල්ලුම් නම්‍යතාව -0.4ක්ද ආනයනවල මිල ඉල්ලුම් නම්‍යතාව -0.5ක්ද වේ නම් විනිමය අනුපාතය අවප්‍රමාණ කළහොත් කුමක් සිදුවේ ද?
(1) වෙළෙඳ ශේෂයේ හිඟයක් පවතීනම් එය ඉහළ යයි.
(2) ජංගම ගිණුමේ හිඟයක් පවතීනම් එය ඉහළ යයි.
(3) සමස්ත ශේෂයේ හිඟයක් පවතීනම් එය ඉහළ යයි.
(4) අපනයන ඉපයුම් නොවෙනස්ව පවතිද්දී ආනයන වියදම් අඩුවේ.
(5) වෙළෙඳ ශේෂයේ අතිරික්තයක් පවතීනම් එය ඉහළ යයි.

42. ස්ථාවර විනිමය අනුපාත ක්‍රමයක් ක්‍රියාත්මක වන විට දේශීය උද්ධමනය විදේශීය උද්ධමනය ඉක්මවා යයි නම්
(1) විනිමය අනුපාතය ක්ෂයවීමට ලක්වේ.
(2) විනිමය අනුපාතය අධිප්‍රමාණය වේ.
(3) විනිමය අනුපාතය අධිතක්සේරු වේ.
(4) ශුද්ධ ජාත්‍යන්තර සංචිත ඉහළ යයි.
(5) දේශීය මුදල් සපයුම වැඩි වේ.

43. ඉහළ ආර්ථික වෘද්ධි අනුපාතයක් පවත්වා ගැනීම සඳහා යෝග්‍ය ප්‍රතිපත්තිය කුමක් ද?
(1) දැඩි නියාමන මගින් පරිසරයේ ගුණාත්මක බව ආරක්ෂා කිරීම
(2) භෞතික හා මානව ප්‍රාග්ධනයේ ආයෝජන ඉහළ නැංවීම
(3) මුදල් සැපයුම වැඩිකර නිමැවුම සඳහා අධිඉල්ලුමක් ජනිත කිරීම
(4) දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීමට දැඩි ආරක්ෂණවාදී ප්‍රතිපත්ති යොදා ගැනීම
(5) ඍජු බදු වෙනුවට වක්‍ර බදු හඳුන්වාදීම සහ නිෂ්පාදන පිහිටාධාර ඉවත්කිරීම

44. “ශ්‍රී ලංකාව තවමත් මානව සංවර්ධන දර්ශකයේ අගය 0.8 කරා පැමිණීමට අසමත් වී ඇත.” මෙයට මූලික සාධකයක් වී ඇත්තේ
(1) ආර්ථිකය තුළ දිගුකාලීනව ඉහළ උද්ධමනයක් පැවතීම ය.
(2) සේවා වියුක්තිය පහළ මට්ටම පැවතුනද ඉතා ඉහළ ඌණ සේවා නියුක්තියක් පැවතීම ය.
(3) අති විශාල ප්‍රතිශතයක් අතරමගදී පාසල් හැරයාම ය.
(4) ඒක පුද්ගල ආදායමේ සිදුවන මන්දගාමී වර්ධනය ය.
(5) දුර්වල සෞඛ්‍ය පහසුකම් නිසා නීරෝගී බව අහිමි වීම ය.

45. “යම් ආර්ථිකයක කුටුම්බ ආදායම් ව්‍යාප්තියේ ගිනි සංගුණකය 2000දී 0.35ක් වූ අතර 2020දී 0.45ක් වී තිබේ.” මෙම වෙනසට හේතුවක් ලෙස සැලකිය හැක්කේ පහත සඳහන් ඈ අතුරින් කුමක් ද?
(1) ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම
(2) ශ්‍රමයට ඇති ඉල්ලුම ඉහළයාම නිසා කම්කරු වැටුප් ඉහළ යාම
(3) රජය ආදායම් බදු අනුපාත 10% කින් ඉහළ නැංවීම
(4) සම්පත් බෙදා වෙන්කිරීම සඳහා රාජ්‍ය අංශය වෙනුවට වෙළෙඳපොළ බලවේගවලට ඉඩ දීම
(5) සහනාධර වැඩසටහන් සඳහා රාජ්‍ය වියදම් ප්‍රතිශතය ඉහළ දැමීම



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

46. ඇමරිකාවේ බදු ප්‍රතිපත්තිය මත ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තශාලාවක් වසා දැමීම හේතුවෙන් එහි සේවය කළ පුද්ගලයින් 600කට රැකියා අහිමි වේයැයි සිතන්න. මෙම සේවා වියුක්තිය අයත් වන්නේ
(1) සාර්ෂික සේවා වියුක්තියට ය.
(2) වාරික සේවා වියුක්තියට ය.
(3) ව්‍යුහමය සේවා වියුක්තියට ය.
(4) ඉච්චානුගත සේවා වියුක්තියට ය.
(5) චක්‍රීය සේවා වියුක්තියට ය.

47. මානව සංවර්ධනය සහ තිරසාර සංවර්ධනය එකිනෙකින් වෙනස් වනුයේ පහත සඳහන් කවර කරුණක් නිසාද?
(1) ආර්ථික පැතිකඩ
(2) සමාජ පැතිකඩ
(3) පාරිසරික පැතිකඩ
(4) අධ්‍යාපනික පැතිකඩ
(5) සෞඛ්‍ය පැතිකඩ

48. 2025 මානව සංවර්ධන වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ මානව සංවර්ධනය නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද?

| | දර්ශකයේ අගය සහ ස්ථානය | අපේක්ෂිත ආයුකාලය (අවුරුදු) | ක්‍රයශක්ති සාම්‍ය ඒක පුද්ගල ද. ජා. ආදායම $ |
|---|---|---|---|
| (1) | 0.776/89 | 77.5 | 12 616 |
| (2) | 0.786/78 | 75.6 | 11 980 |
| (3) | 0.780/78 | 76.6 | 11 899 |
| (4) | 0.782/73 | 78.5 | 12 426 |
| (5) | 0.800/72 | 77.4 | 11 891 |

49. වයස අවුරුදු 15 හෝ වැඩි ජනගහනයෙන් සේවා නියුක්ත සහ සේවා වියුක්ත ජනගහනය ප්‍රතිශතයක් ලෙස දැක්වූ විට එය
(1) සේවා නියුක්ති අනුපාතිකයයි.
(2) සේවා වියුක්ති අනුපාතිකයයි.
(3) ශ්‍රමබලකාය සහභාගීත්ව අනුපාතයයි.
(4) මුළු යැපුම් අනුපාතයයි.
(5) වැඩිහිටි යැපුම් අනුපාතයයි.

50. ශ්‍රී ලංකාවේ වර්තමානයේදී ලාභ ලබන රාජ්‍ය ව්‍යවසායන් පමණක් අඩංගු පිළිතුර හඳුනාගන්න.
(1) ලංකා බැංකුව, විදුලි බල මණ්ඩලය, ඛණිජ තෙල් නීතිගත සංස්ථාව
(2) ශ්‍රී ලන්කන් ගුවන් සමාගම, මහජන බැංකුව, ලංකා සීනි සමාගම
(3) ගමනා ගමන මණ්ඩලය, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව,ලංකා සතොස
(4) ශ්‍රී ලංකා තැපැල්, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, රාජ්‍ය ඉන්ජිනේරු සංස්ථාව
(5) ගමනාගමන මණ්ඩලය, දුම්රිය සේවය, ලංකා සතොස



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**අවසාන වාර පරීක්ෂණය • 13 ශ්‍රේණිය - 2025**

**ආර්ථික විද්‍යාව II**
**Economics II**

**21 | S | II**

**පැය තුනයි**
**Three Hours**

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි**
**Additional Reading Time – 10 Minutes**

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරාගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛතාවය ලබාදෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදා ගන්න.**

**උපදෙස්:**
- **'අ' උපකොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද, 'ආ' උපකොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

## 'අ' උපකොටස
(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරාගන්න.)

1. (i) 'ආර්ථික විද්‍යාව තේරීමේ විද්‍යාවකි.' මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ල. 05)
   (ii) සම්පත් බෙදී යාමේ කාර්යක්ෂමතාව යන්නෙන් කුමක් අදහස් කෙරේ ද? වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක සම්පත් බෙදීයාමේ කාර්යක්ෂමතාව ඉටුවන්නේ කෙසේ ද? සාකච්ඡා කරන්න. (ල. 05)
   (iii) 'ප්‍රායෝගිකව නිෂ්පාදන හැකියා වක්‍රයක් මූලයට අවතලව පිහිටයි.' මෙයට හේතු විමසන්න. (ල. 05)
   (iv) මධ්‍ය සැලසුම්කරණය බිඳවැටීමට බලපෑ සාධක කවරේ ද? (ල. 05)

2. (i) සාමාන්‍ය ඉල්ලුම් වක්‍රයක් (වෙළෙඳපොළක) පහළට බෑවුම් වන්නේ ඇයි? හේතු පැහැදිලි කරන්න. (ල. 04)
   (ii) තරඟකාරී වෙළෙඳපොළක සමතුලිතය සහ අසමතුලිතය අතර වෙනස විග්‍රහ කරන්න. (ප්‍රස්තාර සටහන් භාවිත කරන්න.) (ල. 05)
   (iii) මිල ඉල්ලුම් නම්‍යතාව නිර්වචනය කර විවිධ භාණ්ඩවල නම්‍යතාව එකිනෙකින් වෙනස්වීමට හේතු පෙන්වා දෙන්න. (ල. 05)
   (iv) පහත සඳහන් සිදුවීම් තරඟකාරී 'බුලත්' වෙළෙඳපොළක සමතුලිතයට ඇතිකරන බලපෑම ප්‍රස්තාරිකව පැහැදිලි කරන්න.
      a) බුලත් විට කෑම මුඛ පිළිකාවකට හේතු වෙන බව ප්‍රචාරය වීම
      b) වගා කෙරෙන ප්‍රදේශවල දිගු නියඟයක් හටගැනීම
      c) විශාල වශයෙන් කම්කරු රැකියා අහිමි වීම (ල.2*3=6)

3. (i) තරඟකාරී වෙළෙඳපොළක අලෙවිවන භාණ්ඩයක් සඳහා නිශ්චිත නිෂ්පාදන බද්දක් පැනවූ විට සම්පත් බෙදී යාම අකාර්යක්ෂම වන ආකාරය ප්‍රස්තාර සටහනක් භාවිතයෙන් පැහැදිලි කරන්න. (ල. 05)
   (ii) නාඩු සහල් සඳහා සඵල උපරිම මිලක් නියම කර රජය එය කළමණාකරණයට ඉදිරිපත් නොවේ නම් වෙළෙඳපොළේ ඇතිවන තත්ත්වයන් විස්තර කරන්න. (ල. 05)
   (iii) වී ගොවීන් සඳහා සහතික මිලක් ගෙවීමට රජය එකඟ වී එය ලබා දීමට ඌණ පූර්ණ ගෙවීමක් කිරීමට ඉදිරිපත් වුවහොත් එහි ප්‍රතිවිපාක තරඟකාරී වෙළෙඳපොළ ආකෘතියක් යොදාගෙන විමසන්න. (ල. 05)
   (iv) ශ්‍රී ලංකාවේ බොහෝ එළවළු සහ පළතුරු වර්ගවල වෙළෙඳපොළ මිල ගණන් කෙටිකාලීනව තියුණු උච්චාවචනවලට ලක්වන්නේ ඇයි? හේතු පැහැදිලි කරන්න. (ල. 05)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub

4. (i) හීනවන ආන්තික ඵලදා නීතියට අනුව මුළු ඵලදා වක්‍රයක් ඇඳ වැඩෙන ආන්තික ඵල, හීනවන ආන්තික ඵල, ශූන්‍ය ආන්තික ඵල සහ ඍණ ආන්තික ඵල ලබා දෙන අවස්ථා පෙන්වා දෙන්න. (ල. 05)

(ii) දිගුකාලීන සාමාන්‍ය පිරිවැය කෙරෙහි පරිමාණානුකූල ඵල ඇති කරන බලපෑම විස්තර කරන්න (ල. 05)

(iii) කෙටිකාලයේදී නිෂ්පාදනයේ යෙදෙන පූර්ණ තරඟකාරී ආයතනයක සැපයුම් වක්‍රය ව්‍යුත්පන්න කරන ආකාරය පැහැදිලි කරන්න. (ප්‍රස්තාර සටහන් යොදාගන්න.) (ල. 05)

(iv) "දුම්රිය සේවය, ජල සම්පාදනය සහ විදුලි බලය බෙදා හැරීම ආදී කර්මාන්ත ඒකාධිකාර යටතේ පැවතීම තරඟකාරීත්වයට වඩා සමාජයට හිතකර යැයි පැවසේ." මෙම ප්‍රකාශය ආර්ථික විද්‍යාත්මකව විග්‍රහ කරන්න. (ල. 05)

5. (i) දළ දේශීය නිෂ්පාදිතය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? වියදම් ප්‍රවේශය යටතේ දළ දේශීය නිෂ්පාදිතය ලබාගැනීමට එකතු කළ යුතු වියදම් කවරේ ද? (ල. 05)

(ii) ආදායම් ප්‍රවේශය යටතේ දළ ජාතික ආදායම ගණනය කිරීමට එකතු කළ යුතු ආදායම් මූලාශ්‍ර නම් කරන්න. (ල. 04)

(iii) නිෂ්පාදන ක්‍රමයට දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරනවිට ව්‍යාපාරික ආයතන නිමැවුමේ වටිනාකම වෙනුවට එහි දළ එකතුකළ අගය ලබගන්නේ ඇයි? (ල. 04)

(iv) ආර්ථිකයක: $C=60+0.6Yd$; $Tx=110$; $Tr=10$; $I=80$; $G=120$; $Nx=$ ශුද්ධ අපනයන $=0$ යැයි සිතන්න.

a) සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න. (ල. 02)

b) සමතුලිත ආදායම් මට්ටමේ දී පරිභෝජනය සහ ඉතුරුම් සොයන්න. (ල. 02)

c) මෙම ආර්ථිකයේ කුටුම්බ සංක්‍රාම තවත් 10කින් වැඩිකළහොත් පරිභෝජන වියදමේ සිදුවන ඉහළ යාම කොපමණ ද? (ල. 02)

d) මෙම ආර්ථිකයේ වියදම් ගුණකයේ අගය කොපමණ ද? (ල. 01)

## 'ආ' උපකොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරාගන්න.)

6. (i) මිනිසුන් මුදල් සොයාගැනීමට හේතු වූ කරුණු මොනවාද? (ල. 04)

(ii) කේන්ස් ඉදිරිපත් කළ "ද්‍රවශීලතා වරණය" පැහැදිලි කරන්න. (ල. 04)

(iii) ඉල්ලුම් උද්ධමනය පිළිබඳ මුදල් ප්‍රමාණවාදී විග්‍රහය සහ කේන්සියානු විග්‍රහය අතර වෙනස සාකච්ඡා කරන්න. (ල. 06)

(iv) මූල්‍ය ප්‍රතිපත්තිය යනු කුමක් ද? මහ බැංකුව එය ක්‍රියාත්මක කරන ආකාරය විමසන්න. (ල. 04)

(v) මුදල් ගුණකය සහ තැන්පතු ගුණකය අතර වෙනස පැහැදිලි කරන්න. (ල. 02)

7. (i) පහත සඳහන් භාණ්ඩ සඳහා උදාහරණය බැගින් සපයන්න.

a) පොදු භාණ්ඩ b) අර්ධ පොදු භාණ්ඩ c) පොදු දේපොළ සම්පත්
d) අවගුණ භාණ්ඩ e) ශුභසාධන භාණ්ඩ (ල.1*5=5)

(ii) පහත දැක්වෙන සංකල්ප අතර වෙනස පැහැදිලි කරන්න.

a) පෞද්ගලික පිරිවැය සහ සමාජ පිරිවැය
b) තිරස් සාධාරණත්වය සහ සිරස් සාධාරණත්වය
c) අනුක්‍රමික බදු සහ ප්‍රතික්‍රමික බදු (ල.2*3=6)

(iii) පහත දැක්වෙන්නේ 2026 වර්ෂය සඳහා රාජ්‍ය අයවැය සම්බන්ධ තොරතුරු කීපයකි; සියල්ල රු. බිලියන වලිනි.

| | |
|---|---|
| භාණ්ඩ හා සේවා මිලට ගැනීම් | 3000 |
| බදු ආදායම | 6000 |
| පොලී ගෙවීම් | 4000 |
| වර්තන පැවරුම් සහ සහනාධාර | 1000 |
| ප්‍රාග්ධන වියදම් | 2500 |
| ප්‍රාග්ධන සංක්‍රාම | 1500 |
| ප්‍රදාන | 500 |
| බදු නොවන ආදායම් | 1500 |
| ණය ආපසු ගෙවීම් | 3500 |

a) වර්තන ගිණුමේ ශේෂය b) සමස්ත ශේෂය
c) ප්‍රාථමික ගිණුමේ ශේෂය d) දළ මූල්‍යන අවශ්‍යතා (ල.1*4=4)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(iv) විවිධ මූලාශ්‍රවලින් අයවැය හිඟය පියවීමට දිගින් දිගටම ණය ලබාගැනීම නිසා ඇතිවන ආර්ථික ප්‍රතිවිපාක සාකච්ඡා කරන්න. (ල. 05)

8. (i) "යම් රටකට කිසිදු භාණ්ඩයක් සම්බන්ධයෙන් නිරපේක්ෂ වාසියක් නොපවතීනම් ජාත්‍යන්තර වෙළෙඳාමෙන් වාසි ලැබිය නොහැක." මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න. (ල. 04)

(ii) 'ආරක්ෂණවාදය' යන්නෙන් කුමක් අදහස් කෙරේද? එයට පක්ෂව ඉදිරිපත්කළ හැකි තර්ක කවරේ ද? (ල. 04)

(iii) 'ගෝලීයකරණයේ සීඝ්‍රතාව ඉහළයාමත් සමඟ එහි අවාසිද මතුවෙමින් පවතී.' එවැනි අවාසි හතරක් ලියන්න. (ල. 04)

(iv) ගෙවුම් ශේෂයේ 'සමස්ත හිඟයක්' යන්නෙන් කුමක් අදහස් කෙරේද? එවැනි හිඟයක් ඉවත් කිරීමට තාවකාලිකව ගත හැකි ක්‍රියාමාර්ග කවරේද? (ල. 04)

(v) ශ්‍රී ලංකා රුපියල සහ එක්සත් ජනපද ඩොලරය අතර පාවෙන විනිමය අනුපාතයක් ඇති බවත් අනෙකුත් සාධක නොවෙනස්ව පවතින බවත් උපකල්පනය කරන්න. පහත සඳහන් සිද්ධීන් ශ්‍රී ලංකා රුපියලේ බාහිර අගයට බලපාන ආකාරය ප්‍රස්තාර සටහන් භාවිතයෙන් පෙන්වා දෙන්න.

a) දේශීය මිල මට්ටම ඇමරිකාවේ මිල මට්ටමට වඩා පහළ වැටීම
b) ඇමරිකානු සංචාරකයින්ගේ පැමිණීම අඩුවීම
c) මෙරට ඇඟළුම් සඳහා ඇමරිකානු ඉල්ලුම ඉහළ යාම
d) ඇමරිකාව ශ්‍රී ලංකාවට පනවා ඇති තීරු බදු අනුපාත තව දුරටත් ඉහළ දැමීම (ල. 04)

9. (i) "2020 සිට 2024 දක්වා ශ්‍රී ලංකාවේ ආර්ථික වෘද්ධි අනුපාතිකයේ සාමාන්‍ය අගය සෘණ අගයක් ගෙන තිබේ." මෙයින් අදහස් වන්නේ කුමක් ද? (ල. 04)

(ii) ඌණ සංවර්ධිත රටක් සංවර්ධනය කරා ලඟාවන විට සිදුවන වෙනස්කම් කවරේද? (ල. 04)

(iii) "ලෝක බැංකු වර්ගීකරණයට අනුව ශ්‍රී ලංකාව පහළ මැදි ආදායම් කාණ්ඩය තුළ සිටී." ශ්‍රී ලංකාවට ඉහළ ආදායම් කාණ්ඩයට යාමට ඇති බාධක කවරේ ද? (ල. 04)

(iv) "2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ දරිද්‍රතා රේඛාව මසකට රු. 16 390කි."

a) දරිද්‍රතා රේඛාව යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
b) දරිද්‍රතා රේඛාව භාවිතයෙන් නිරපේක්ෂ දරිද්‍රතාව මනිනු ලබන්නේ කෙසේද?
c) යාවත්කාලීන කළ දරිද්‍රතා රේඛාවට අනුව 2019 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවේ විශාලත්වය කොපමණද? (ල.2*3=6)

(v) ආර්ථික වශයෙන් සක්‍රීය ජනසංඛ්‍යාව සහ ආර්ථික වශයෙන් අක්‍රීය ජන සංඛ්‍යාව අතර වෙනස කුමක් ද? (ල. 02)

10. (i) ශ්‍රී ලංකාවේ අඩු ආදායම් ලාභීන් සඳහා ක්‍රියාත්මක වන සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් 5ක් නම් කරන්න. (ල. 05)

(ii) 1977න් පසුව ශ්‍රී ලංකාවේ මන්දගාමී ආර්ථික වෘද්ධියට හේතු වූ දේශීය සාධක කවරේද? (ල. 05)

(iii) "ශ්‍රී ලාංකික කාන්තාවන් ලක්ෂ 3ක් පමණ මැදපෙරදිග රටවල ගෘහ සේවිකාවන් ලෙස රැකියාවල නියුක්ත වී ඇත." මෙම සංසිද්ධියෙහි ආර්ථික බලපෑම සාකච්ඡා කරන්න. (ල. 05)

(iv) ණය තිරසර විශ්ලේෂණයට අනුව ශ්‍රී ලංකාවේ ණය තිරසාරභාවය ළඟා කරගැනීම සඳහා ඉටු කරගැනීමට අපේක්ෂිත මූලික අරමුණු තුන කවරේ ද? (ල. 05)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources